ගොඩකවෙල ප්‍රාදේශීය සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 26 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 18 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 22 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය.
---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් කරනු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 2,968,488 ක මුදලින්, ටයර් මිලදී ගැනීම වෙනුවෙන් සබරගමුව පළාත් සභාවේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත ගෙවිය යුතු රු.147,439ක ණයහිමි ශේෂය අඩු කිරීමෙන් පසු රු. 2,821,049 ක මුදලක් වූ ශුද්ධ වටිනාකම පමණක් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ඇස්තමේන්තුගත ආදායම වන රු. 6,000,000 ක් ගිණුම් ගත කර තිබුණි. ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් පමණක් 2015 වර්ෂය සඳහා රු. 5,970,650 ක ආදායමක් උපලේඛණ අනුව හඳුනාගෙන තිබුණි. රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන්ද මුද්දර ගාස්තු ආදායම් ලැබෙන බැවින් වර්ෂය සඳහා බිල්කල මුද්දර ගාස්තු ආදායමේ ඌණතාවයක් පැවතින.

(ඇ) ගබඩා ද්‍රව්‍ය, ඖෂධ තොග මිලදී ගැනීමේදී තොග පාලන ගිණුම මඟින් ගිණුම්ගත නොකොට මිලදී ගන්නා තොගයේ මුළු වටිනාකම වැය ගිණුමට හර කර පසුව තොග ගිණුමට මාරු කිරීමේ නිවැරදි නොවූ ගිණුම් ක්‍රමවේදය භාවිතා කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මැයි මස 15 දින විසුරුවාහරින ලද ප්‍රාදේශීය සභාවේ සභිකයින් සඳහා මැයි මස මන්ත්‍රී දීමනා වශයෙන් රු. 220,000 ක් ගෙවා තිබුණද. ප්‍රතිපූර්ණය වී තිබුණේ ඔවුනට හිමි දින 15 ක වැටුප වූ රු. 110,000 ක් පමණි. වැටුප් වියදම රු. 110,000 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබූ අතර, මන්ත්‍රීවරුන්ගෙන් අයකර ගත යුතු රු. 110,000 ක් ගිණුම් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 හා සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ 2014 නොවැම්බර් 18 දිනැති සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක 22/2014 දරන චක්‍රලේඛය ප්‍රකාරව 2014 ඔක්තෝබර් 24 දිනට අඛණ්ඩව දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කල අයට ස්ථිර පත්වීම් ප්‍රදානය කල යුතු වුවද, ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය, වානිජ ව්‍යාපෘති හා රක්වාන උප කාර්යාලයට අදාල අනියම් හා තාවකාලික නිලධාරීන්ගේ වැටුප් වාර්තා අනුව දින 180 සම්පූර්ණ කර නොමැති සේවකයින් 07 දෙනෙකුට ස්ථිර තනතුරු ප්‍රදානය කර තිබුණි. අතර, දින 180 සම්පූර්ණ කරන ලද සේවකයින් තිදෙනෙකුට ස්ථිර පත්වීම් ප්‍රදානය කර නොතිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 8,932,743 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 9,779,362 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු.846,619කින් අඩුවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 8.65 ක අඩුවීමක් විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් වල අඩුවීම හා පුනරාවර්තන වියදම් වැඩිවීමයි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 2,861 | 3,136 | 727 |
| බදු කුලී | 8,183 | 6,274 | 225 |
| බලපත්‍ර ගාස්තු | 1,054 | 988 | - |
| වෙනත් ආදායම් | 41,831 | 44,924 | 13,264 |

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බදු කුලී ආදායම, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ ආදායම් සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 28, සියයට 2.5, සියයට 48 හා සියයට20 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

--------------

සභා බල ප්‍රදේශයේ 2015 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.611,154ක්වූ අතර, එයින් රු. 5,000 ට වඩා වැඩි හිඟයක් පවතින වරිපනම් බදු ඒකක 07කින් රු. 173,426 ක් ලෙස මුළු හිඟය වටිනාකමින් 28% ක් පමණ විය.

2.3.4 ව්‍යාපාර බදු සහ බලපත්‍ර ගාස්තු

---------------------------------

2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ දෙසැම්බර් මස වනවිට වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු ලබා ගත යුතු ආයතන 206 කින් වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු ලබා නොගැනීම හේතුවෙන් සභා අරමුදලට රු. 172,460 ක් අහිමි වීමේ අවදානමක් පැවතුණි. මේ අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ව්‍යාපාරික ස්ථාන, නිෂ්පාදන ව්‍යාපාර, කර්මාන්ත ශාලා, හෝටල්, ආපන ශාලා ආදිය පිළිබඳව සමීක්ෂණයක් සිදුකර හඳුනාගැනීමට කටයුතු නොකිරීමෙන් අයකර ගතහැකි වූ විශාල ආදායමක් සභාවට අහිමි වීමේ තත්වයක් පැනනැගී තිබුණි.

2.3.5 අක්කර බදු

-------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ශේෂය රු.98,251ක්වූ අතර, එයින් රු. 1,000 ට වඩා වැඩි හිඟයක් පවතින අක්කර බදු ඒකක 20 කින් රු.44,092 ක් ලෙස මුළු හිඟ වටිනාකමින් 45% ක් පමණ විය.

2.3.6 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන කොමසාරිස්ගේ 2009 මාර්තු 09 දිනැති අංක 2009/01 දරණ චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව වෙළඳසැල බදුදුන් මුදල ඊළඟ වර්ෂයේදී අවම ලංසුව ලෙස තීරණය කර බදු දීම සිදුකල යුතු වුවත්, ඒ පිළිබඳව නොසලකා ගොඩකවෙල සතිපොල අංක 03 මාළු ලැල්ල හා අංක 05 මාළු ලැල්ල 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී පිළිවෙලින් රු.86,041 ක් හා රු. 234,122 ක් අඩුවෙන් රු. 122,300 ක් හා රු. 121,378 ක් ලෙස තීරණය කර බදු තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව බදු මුදල් අතර තරඟකාරීත්වයක් ඇති කරමින් බදු දීමට කටයුතු නොකිරීමෙන් 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂය තුලදී සභාවට රු. 320,163 ක මුල්‍ය පාඩුවක් ඇති වී තිබුණි.

(ආ) (i) ගොඩකවෙල සතිපොල අංක 02 මාළු ලැල්ලේ වාර්ෂික බදු මුදල රු. 303,220 ක් ලෙස තීරණය කර ටෙන්ඩර් කැඳවා තිබූ නමුත් ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් නොවීම මත 2015 වර්ෂය වෙනුවෙන් බදු නොතිබූ අතර, නැවත තරඟකාරීත්වයක් ඇති කරමින් බදු දීමට කටයුතු නොකිරීමෙන් සභාවට එකී මුල්‍ය පාඩුවක් සිදුවී තිබුණි.

(ii) පළාත් පාලන කොමසාරිස්ගේ 1998 දෙසැම්බර් 10 දිනැති අංක 98/3 දරන චක්‍රෙල්ඛය අනුව ගොඩකවෙල සතිපොල බදුදීමේදී බදුකරු සමඟ ගිවිසුම් අත්සන් කිරීමට පෙරාතුව හය මසක කුලියට සමාන මුදලක් හෝ අවම වශයෙන් මාස 03 ක කුලී මුදල් ලෙස රු.454,080ක් ඇප වශයෙන් තැන්පත් කල යුතු වුවත්, මාස 02 ක ඇප ලෙස රු. 332,992 ක් පමණක් ලබාගෙන තිබුණි.

(ඇ) ගොඩකවෙල හා රක්වාන වෙළඳ සංකීර්ණයේ කඩකාමර සඳහා වන මාසික කුලිය 2009 පෙබරවාරි 17 හා 24 දිනැති පළාත් තක්සේරුකරුගේ තක්සේරු වාර්තා මගින් ප්‍රතිසංශෝධනය කර තිබූ නමුත් එම කඩකාමර වල මාසික කුලිය ඒ අනුව සංශෝධනය කිරීමෙන් තොරව සෑම වර්ෂයකම මාසික කුලී මුදල 10% කින් පමණක් වැඩි කර මාසික කුලී ලබා ගැනීම සිදු කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ජනරජයේ 2014 දෙසැම්බර් 19 දිනැති අංක 1894 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් ගාස්තු අයකල යුතු ආකාරය දක්වා තිබූ නමුත් දැන්වීම් පුවරු සවි කරන ලද ආයතන 11 කින් පමණක් ආදායම් අයකර ගෙන තිබූ බවණි. තවද, හඳුනාගෙන ඇති ආයතන 07ක් මගින් ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු සඳහා ආදායම් ලබා ගැනීමට කටයුතු නොකිරීමෙන් රු. 350,769 ක ආදායමක් සභාවට අහිමි වීමේ අවධානමක් ඇති වී තිබුණි.

(ඉ) රක්වාන පැරණි වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ අංක 24, 25, 29 හා 30 කඩකාමර 2012 වර්ෂයේ සිට ටෙන්ඩර් ඉදිරිපත් නොවීම මත බදු නොතිබූ අතර, මේ හේතුවෙන් සභාවට විශාල ආදායමක් සෑම වර්ෂයකදීම අහිමි තිබුණි.

2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උසාවි දඩ අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම මත ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2014 අගෝස්තු සිටද, පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2015 මාර්තු මස සිට ද බලංගොඩ දිසා මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2002 ජූලි සිට ද උසාවි දඩ ආදායම් අයකර ගෙන නොතිබුණි.

(ආ) රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2015 දෙසැම්බර් දක්වා ද ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2015 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වාද මුද්දර ගාස්තු ආදායම් ගෙන්වා ගෙන නොමැති අතර, ඒවා අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) මුද්දර ගාස්තු අයකිරීමේදී උපලේඛණ අනුව තහවුරු කර ගන්නා වටිනාකම සහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් සත්‍ය වශයෙන් ප්‍රේෂණය කරන වටිනාකම අතර වූ රු.90,250 ක වෙනසට හේතු හඳුනා ගෙන නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාව සතු JCB යන්ත්‍රය සඳහා 2015 වර්ෂයේදී රු. 548,481 ක වියදමක් දරා ඇති අතර, එම යන්ත්‍රය දිගින් දිගටම අබලන් තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය. තවද, ප්‍රාදේශීය සභා කසල වල වැසීම, නැවත කසල සඳහා වලවල් කැපීම වැනි කටයුතු සඳහා ප්‍රාදේශීය සභා JCB යන්ත්‍රය යෙදවිය නොහැකි අවස්ථාවන්හීදී අවශ්‍යතාවය මත වෙනත් JCB යන්ත්‍රය යෙදවීමෙන්ද රු. 176,250 ක් වියදම් දරා තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල කටුපිල නඩුවේහේන ඉඩම කැබලි කර වෙන්දේසි කිරීමට අදාලව වෙන්දේසිකරු හා ප්‍රාදේශීය සභාව අතර එකඟවූ ගිවිසුම අනුව හා 1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත විෂයයභාර අමාත්‍යවරයාගේ නියෝග වලට අනුව

විකුණන ලබන ඉඩම් ප්‍රමාණයෙන් 10% ක භූමිභාගයක් එනම් පර්චස් 138.47 ක් පොදු කටයුතු සඳහා සභාව වෙත ඔප්පුවක් මඟින් ලබාදිය යුතු වුවත්, ඒ සඳහා ප්‍රශස්ථ ඉඩම් කොටසක් වෙන් නොකර දැඩි බෑවුමක් සහිත බිම් කොටසක් සමඟ පර්චස් 78.7ක් වෙන්කර තිබුණි. තවදුරටත් පොදු කටයුතු සඳහා අදාල බිමෙන් පර්චස් 59.77 ක් සභාවට පවරා ගතයුතු වුවත්, එසේ සිදු නොකිරීම තුලින් රු. 400,000 ක නාමික වටිනාකමක් වූ පාඩුවක් සිදුකර තිබූ අතර, බදු මුදල් ලෙස 2015 සැප්තැම්බර් 15 දිනට විකුණන ලද ඉඩම් කට්ටි වලට අදාලව ලැබිය යුතු මුදල විගණනය මඟින් පෙන්වා දීමෙන් අනතුරුව ඉඩම් ගනුදෙනුව අවසන් වී වර්ෂ 02 කට පසුව රු. 376,898 ක මුදල නැවත සභා අරමුදලට බැර කර තිබුණි.

(ඇ) බලවින්න ගොවිපල හා බැකෝ යන්ත්‍රය සේවයේ යෙදවීම වෙනුවෙන් වන ආදායම් හා වියදම් වෙනුවෙන් වෙනම ගිණුමක් වාණිජ ගිණුම නමින් පවත්වා තිබූ අතර ප්‍රධාන ගිණුමෙන් වාණිජ ගිණුමට කරනු ලබන වියදම් අත්තිකාරම් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. ප්‍රධාන ගිණුමෙන් ලබාදුන් රු. 704,054 ක අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වාණිජ ගිණුම ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබූ අතර, වාණිජ ගිණුමේ අපේක්ෂිත අරමුණු කරා ලඟා වීමට නොහැකි වී තිබුණි.

(ඈ) ණයහිමි ලේඛණය අනුව ණයහිමි ශේෂ නොපියවීම හෝ ලේඛණ නඩත්තු නොවීම මත 2013 හා 2014 වර්ෂයන්ට අදාලව රු. 1,461,040 ක ශේෂයක් නිරීක්ෂණයක් වූ නමුත් එකී ණය පියවීමට හෝ ලේඛණ නිවැරදි කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) 2013 වර්ෂය තුලදී සභාවට ලද ආදායම් මඟින් ලබාගෙන තිබූ එකතු තුළ අගය මත බදු මුදල් වූ රු. 145,537 ක් එකී වර්ෂයේ එකතු කළ අගය මතු බදු වියදමට හිලව් කර ප්‍රේෂණය කල යුතු ප්‍රමාණය දේශිය ආදායම් කොමසාරිස් ජෙනරාල්ට ප්‍රේෂණය කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් තැන්පත් ලෙස රඳවාගෙන තිබුණි.

(ඊ) රක්වාන වෙළඳ සංකීර්ණයේ කඩකාමර මඟින් හා සභාව සතු බිම් කොටස් බදු ලබාදීම මඟින් කඩකුලී හා බිම් බදු රු. 179,479 ක් හිඟ හිටවා තිබූණි. එම හිඟ ශේෂයන් තවදුරටත් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

ප්‍රාදේශීය සභාව වෙනුවෙන් රු. 113,240 ක් වටිනාකමැති අල්මාරියක්, මේස, පුටු හා වීජී ලාම්පු මිලදී ගෙන තිබුණි. එම මිලදී ගැනීම් සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:8:4 ප්‍රකාරව ආයතන ප්‍රධානී විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කල යුතු අතර, එමඟින් මිලදී ගතයුතු භාණ්ඩයේ පිරිවිතර හඳුනාගත යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. උක්ත පිරිවිතරයන් මත ආයතනයට අවශ්‍ය භාණ්ඩ මිල ගණන් කැඳවා ආයතනයට උපරිම වාසියක් අත්වන අන්දමින් මිලදී ගතයුතු වුවත්, අවම මිල පමණක් පදනම් කර ගනිමින් මිලදී ගැනීම සිදුකර තිබුණි. මිලදී ගැනීම් සම්බන්ධයෙන් තාක්ෂණික කමිටු වාර්තා හෝ සභාවේ තාක්ෂණික නිලධාරීන්ගේ වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

-----------------------

පසුගිය කාල පරිච්ඡේදයේ සභාවේ ජයග්‍රහණ හා ප්‍රගතිය පිළිබඳ ලංකාදීප පුවත්පතේ මිණිපුර අතිරේකයේ සභා අරමුදලින් රු. 80,808 ක වියදම් දරා පිටුවක දැන්වීමක් පල කර තිබුණි. එම ගෙවීම 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියට අනුව සභා අරමුදල් යෙදවිය හැකි කරුණු යටතට නොගැනෙන වියදමක් බැවින් පනතේ විධිවිධාන උල්ලංගනය කරමින් සිදුකර තිබූ ගෙවීමක්

බව නිරීක්ෂණය විය. තවද, ඒ සඳහා විෂයයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය හෝ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 මාළු වෙළඳ පොළ සඳහා වන භූමිය සංවර්ධනය කිරිම
------------------------------------------------------------

(අ) රත්නපුර ඇඹිලිපිටිය, ප්‍රධාන මාර්ගයේ මාදම්පේ මංසන්ධිය අසල දිනපතා අනවසරයෙන් පවත්වා ගෙන යනු ලබන මහාපරිමාණ මාළු වෙළඳපල සඳහා කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට වගුරු භූමිය රජයට අත්පත් කර ගැනීමෙන් අනතුරුව සංවර්ධනය කර මාළු වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ මූලික පියවර වශයෙන් අදාල බිම පස් පුරවා සංවර්ධනය කිරීමට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ අරමුදල්, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව අනුමත කර තිබුණි.

(ආ) පස් ගොඩකිරීමේ කටයුතු සඳහා වන රු. 1,000,000 ක වියදම් ඇස්තමේන්තුවක් 2014 පෙබරවාරි 05 දින ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරී විසින් පිළියෙල කර සභාපතිවරයා විසින් අනුමත කර අනතුරුව ගොවි සංවිධානයක් සමඟ 2014 පෙබරවාරි 05 දින රු. 966,435 ක මුදලකට, මාස 03 ක ගිවිසුම්ගත කාලයක් සඳහා ගිවිසුමකට එළඹ තිබුණි.

(ඇ) 2014 සැප්තැම්බර් 23 දින පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යංශයන් ලද රු. 1,000,000 ක මුදල ප්‍රාදේශීය සභා අරමුදලට බැර කර තිබූ අතර, 2014 සැප්තැම්බර් 25 දින විවිධ අඩුකිරීම් වශයෙන් රු.270,039ක් අඩු කර ගැනීමෙන් අනතුරුව කොන්ත්‍රාත්කරුට රු. 729,961 ක මුදලක් ගෙවීම් කර තිබුණි.

එසේ වුවද, ගිවිසුම්ගත වූ සමිතිය නියමිත වැඩ ඇස්තමේන්තු අනුව ටිපර් රථ මඟින් පස් ප්‍රවාහනය කල බවට ආයතනය වගකිව යුතු නිලධාරියෙකු මඟින් හෝ බාහිර සාක්ෂි මඟින් තහවුරු නොවුණි. ඒ අනුව ඉහත වවුචර්පත් මඟින් ගෙවීම් කරන ලද මුළු මුදල වූ රු.10,000,000 අදාල කොන්ත්‍රාත්කාර සමිතිය විසින් ඉටු නොකල වැඩක් වෙනුවෙන් කරන ලද සාවද්‍ය ගෙවීමක් බව විගණනය විසින් නිරීක්ෂණය කරනු ලැබේ.

3.5 කොන්ත්‍රාත් පරිපිලනය
-------------------------

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ව්‍යාපෘති යටතේ 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කල ගමින් ගමට දොරින් දොරට වැඩ සටහන යටතේ සභාව මඟින් ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් අවසන් කල කර්මාන්ත 08 ක් සඳහා රු. 11,349,433 ක් අදාල කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතුව තිබුණි.

(ආ) ගිවිසුම් අත්සන් කරන ලද නමුත් රු. 1,458,095 ක වටිනාකමැති කර්මාන්ත 04 ක් 2016 මැයි මාසය අවසන් වනවිටත් වැඩ ආරම්භ කර නොතිබුණි.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------

කසල කළමනාකරණය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදීද නිසි වැඩපිළිවෙලක් නොවූ අතර, නගරයේ එකතු වන කසල බලවින්න ගොවිපලේ විවෘත භූමියක වලවල් කපා දිරන හා නොදිරන කසල සියල්ල වල දැමීම වර්තමානය වන විටද ක්‍රියාත්මක කර තිබුණි. කසල බැහැර කිරීම සඳහා වලවල් කැපීම වෙනුවෙන් ප්‍රාදේශීය සභා බැකෝ යන්ත්‍රය මෙන්ම, රු. 176,250 ක වියදමින් වෙනත් බැකෝ යන්ත්‍රයක්ද යොදවා ගෙන තිබුණි. මේ සඳහා පරිසර අධිකාරියෙන් බලපත්‍රයක්ද ලබාගෙන නොතිබුණි.

3.7 වත්කම් කළමනාකරණය
----------------------------
(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
----------------------------------------

අංක 53–5625 දරණ මිට්සුබිෂි කැබ් රථය හා අංක 37 – 9509 දරණ කුබෝටා ට්‍රැක්ටර් රථය සභාවේ කාර්යයන්ට හෝ ආදායම් උත්පාදිත කාර්යයකට හෝ යොදා නොගෙන නිශ්කාර්යයව ගාල් කර තිබූ අතර, ඉන් 37 – 9509 දරණ කුබෝටා ට්‍රැක්ටර් රථය 2015 වර්ෂයේදී රු.319,880ක වියදම් දරා අළුත්වැඩියාවන් සිදුකර තිබුණි.

(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

---------------------------------------------------------------

(I) සභාව විසින් ඉදිකර තිබූ පැරණි පුස්තකාල ගොඩනැගිල්ල වර්ෂ කිහිපයක සිට විවිධ පුද්ගලයින් වෙත බදු ලබාදී ආදායම් උත්පාදනය කරගෙන තිබූ නමුත්, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බවත්, එම ඉඩම ප්‍රාදේශීය සභාවට පවරාගෙන නොමැති බැවින් එම ඉඩම් කොටස නිදහස් කරන ලෙසත් දැනුම් දී තිබුණි. මේ අනුව එම ගොඩනැගිල්ල හා පිහිටි ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු නොකිරීමෙන් හා ඒ පිළිබඳව මේ වනතෙක් ඉඩමේ අයිතිය පිළිබඳව නිරවුල් කර ගැනීමකින් තොරව දීර්ඝ කාලයක් තිස්සේ කටයුතු කිරීමෙන් සභාවට ආදායම් උත්පාදනය වන එකී ඉඩම හා ගොඩනැගිල්ල සභාවට අහිමි වීමේ අවධානමක් ඇති වී තිබුණි.

(II) විවිධ ආයතන වලින් සභාව වෙත මෑතකාලීනව ලැබී තිබූ කැබ් රථ, ට්‍රැක්ටර් සහ ට්‍රේලර්, ජල ටැංකි, ජල බවුසර්, ෆෝටෝන් ඩම්ප්ට්‍රක් රථය වශයෙන් වාහන 09 කට අදාල ලියාපදිංචි සහතික සභාව සතුව නොමැති බවත්, ඒවා විධිමත් පරිදි සභාව වෙත පවරා නොමැති බවත් නිරීක්ෂණය විය.

04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය
----------------------------------------
4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම
---------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

05. පද්ධති හා පාලනය
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය